චක්‍රලේඛ අංකය:PE/2024/65

මගේ අංකය :- FE/101/P.E./2024
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2024.11.18

සියළුම අමාත්‍යාංශ ලේකම්වරු, පළාත් සභා ප්‍රධාන ලේකම්වරු හා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් හා සෙසු ව්‍යවස්ථාපිත කොමිෂන් සභා ලේකම්වරු,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීහු හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරු,
පළාත් ආණ්ඩුකාරවර ලේකම්වරු,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරු,
සියළුම සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරු/ සාමාන්‍යාධිකාරිවරු,

## පාර්ලිමේන්තු මැතිවරණය - 2024.11.14
## මැතිවරණ කාර්ය මණ්ඩලයට ගෙවීම්

2024.11.14 දින පවත්වන ලද පාර්ලිමේන්තු මැතිවරණයේදී මැතිවරණ කොමිෂන් සභාවේ හෝ දිස්ත්‍රික් තේරීම්භාර නිලධරයාගේ උපදෙස් අනුව මැතිවරණ රාජකාරිවල නිරත වූ කාර්ය මණ්ඩලයට ගෙවිය හැකි ගාස්තු ප්‍රමාණ හා එම ගෙවීම්වලට අදාළ ගිණුම් කාර්යය පරිපාටිය පහත සඳහන් කර ඇත.

**02.** මැතිවරණ රාජකාරි සඳහා ගෙවීම් කිරීමට පෙර මෙම චක්‍රලේඛයේ ඇතුළත් කරුණු මැනවින් අධ්‍යයනය කර ගෙවීම් කරන ලෙස ඔබගේ ගිණුම් කාර්යය මණ්ඩලයට උපදෙස් දිය යුතුය. මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස්වලින් පරිබාහිරව සිදුකරන ගෙවීම් ප්‍රතිපූර්ණය නොකරන අතර එවැනි ගෙවීම් සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම ගෙවීම් කරන නිලධරයා විසින් භාර ගත යුතුය.

**03.** මැතිවරණ කාර්යය මණ්ඩලයට ගෙවීම් කළයුතු ස්ථාන හා එම ස්ථානවලින් සිදු කළයුතු ගෙවීම් පහත සඳහන් පරිදි කාණ්ඩ දෙකකට වර්ගීකරණය කර ඇත. ගෙවීම් කරන නිලධරයා විසින් එම ගෙවීම් කරන ස්ථාන හා ගෙවීම් පැහැදිලිව හඳුනාගෙන, ඒ අනුව ගෙවීම් කළයුතුය.

**අ) තම ස්ථිර සේවා ස්ථානයෙන් කරනු ලබන ගෙවීම්**

මැතිවරණ කොමිෂන් සභාවේ හෝ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගේ උපදෙස් මත පහත සඳහන් කාර්යයන්හි නිරත වූ රජයේ කාර්යාල/ ආයතනවල ස්ථිර කාර්යය මණ්ඩලයට හා අනියුක්ත සහායකයන්ට පහත දක්වා ඇති උපදෙස්වලට අනුව තම ස්ථිර සේවා ස්ථානයෙන් ගමන් වියදම් හා දීමනා ගෙවිය හැකිය. එම ගෙවීම් පිළිබඳ විස්තර මෙම චක්‍රලේඛයේ 10.1 හා 10.2 අනුච්ඡේදවල සඳහන් උපලේඛන සමඟ ඉහත ලිපිනයට ඉදිරිපත් කළ පසු එම මුදල් මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රතිපූර්ණය කිරීම හෝ ඊට අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීම කරනු ලැබේ.

I. කලාප භාර සහකාර තේරීම්භාර නිලධරයකු වශයෙන් කටයුතු කිරීම.

II. ඡන්දපොළක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති, අතිරේක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති, කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති, විශේෂ/ අතිරේක කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු, ලිපිකරුවකු හෝ කාර්යාල සේවක සේවකයකු වශයෙන් කටයුතු කිරීම.

III. ඡන්ද පෙට්ටි නිකුත් කිරීමේ ශාලාවක දී ඡන්ද පත්‍රිකා හා ඡන්ද පෙට්ටි ආදිය නිකුත් කිරීමේ හා ආපසු භාර ගැනීමේ කාර්යයන්වල නිරත වීම.

IV. ඡන්ද ගණන් කිරීමේ ශාලාවක ගණන් කිරීමේ කටයුතු කිරීම හා ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ ශාලාවක ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ/ වගුගත කිරීමේ කටයුතුවල නිරත වීම.

වැදගත්:-

- ගෙවීම් කිරීම සඳහා කලාප අධ්‍යාපන කාර්යාලවල අක්මුදල් ප්‍රමාණවත්ව නොමැති නම් (විදුහල්පතිවරුන් හා ගුරුවරුන් ආදි පාසැල් සේවය කරන කාර්යය මණ්ඩලය ඇතුලු) මෙම චක්‍රලේඛයේ 10.1 හා 10.2 අනු ඡේදවල සඳහන් උපලේඛන සම්පූර්ණ කර මැතිවරණ කොමිෂන් සභාවේ ඉහත ලිපිනයට එවීමෙන් ගෙවීම් කිරීම සඳහා අවශ්‍ය අක්මුදල් ලබාගත හැක.
- මැතිවරණ රාජකාරි සඳහා පත්වීම් ලිපියක් හා රාජකාරි ඉටුකළ බවට පැමිණීමේ සහතිකයක් ලබාදී ඇති බැවින් ඉහත දීමනා ගෙවීම සඳහා එම ලියවිලි ගෙවීම් වවුචරයට අමුණා තැබීම අත්‍යවශ්‍ය වේ.

ආ) දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින් සිදු කරන ගෙවීම්

පහත සඳහන් කාර්යයන්වල සේවයේ නියුතු කාර්යය මණ්ඩලයට ඔවුන් සේවය කළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන් ඔවුන්ට හිමි දීමනා ගෙවනු ලැබේ.

i. පත්වීම් ලිපි/ ලිපිගොනු භාර ගැනීමට කලින් දිනයක පැමිණීම.

ii. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගේ උපදෙස් මත මූලික කටයුතුවල නිරත වීම.

iii. සුභසාධන/ ප්‍රවාහන/ පොදු පහසුකම්/ ශාලා සකස් කිරීම/ ගණන් කිරීමේ ශාලා සම්බන්ධීකරණ කමිටු වැනි ඒවායේ සේවය කිරීම.

iv. මැතිවරණ ආරවුල් නිරාකරණය කිරීමේ ඒකකයේ (EDR) සේවයේ නිරතවීම වෙනුවෙන් ගෙවීම.

v. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඡන්දපොළ කාර්යය මණ්ඩල සංචිත පවත්වාගෙන යාමේ කටයුතු කිරීමේ කාර්යය මණ්ඩලයට දීමනා ගෙවීම.

vi. ඡන්දපොළ වෙත වාහන රැගෙන ගිය ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ගේ හා එම වාහන රියදුරුගේ දීමනා ගෙවීම.

vii. සේවා අපේක්ෂාවෙන් රැඳී සිටීම (පොරොත්තු සේවා)

viii. තේරීම්භාර නිලධාරි කාර්යාල/ මැතිවරණ කාර්යාලවලින් පමණක් ගෙවිය යුතු යැයි විශේෂයෙන් සඳහන් කර ඇති ගෙවීම්.

ix. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කාර්යාලයක (ඡන්ද ප්‍රාදේශ මට්ටමින්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පිහිටුවනු ලැබූ කාර්යාලයක) සේවය කළ කාර්යය මණ්ඩලයට දීමනා ගෙවීම.

x. ඉහත 03 ඡේදයේ (අ) අනුඡේදය යටතේ නිශ්චිතව සඳහන් නොවූ වෙනත් මැතිවරණ රාජකාරි සඳහා වූ ගෙවීම්

ඉහත (ආ) අනුඡේදය යටතේ වූ කාර්යයන්හි සේවයේ නියුතු ස්ථිර කාර්ය මණ්ඩලය හා සේවකයින් අදාළ තේරීම්භාර නිලධාරී/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්ගේ උපදෙස් පරිදි අදාළ වවුචර් සහ උපකාරක ලියවිලි හැකි ඉක්මණින් තමන් සේවය කළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.

**04. ගමන් වියදම් හා සංයුක්ත දීමනා**

මැතිවරණ රාජකාරි සඳහා පත්කිරීමේ ලිපියකින් හා පත්කළ කාර්යය ඉටුකළ බවට පැමිණීමේ සහතිකයකින් සනාථ කෙරෙන්නේ නම් ඉහත 03 ඡේදයේ සඳහන් මැතිවරණ රාජකාරි සඳහා පහත දැක්වෙන විශේෂ අවස්ථා ඇතුළත්ව ආයතන සංග්‍රහයේ XIV වන පරිච්ඡේදයෙහි දැක්වෙන පරිදි ගමන් වියදම් හා සංයුක්ත දීමනා ලබා ගැනීමට නිලධාරීන්ට හිමිකම ඇත.

4.1 ප්‍රධාන ගණන් කිරීමේ නිලධරයකු, නියෝජ්‍ය ප්‍රධාන ගණන් කිරීමේ නිලධරයකු, සහකාර තේරීම්භාර නිලධරයකු, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු, අතිරේක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු, විශේෂ/ අතිරේක කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු, කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු, ඡන්දපොළ ලිපිකරුවකු හෝ කාර්යාල සේවක සේවකයකු වශයෙන් තෝරාගෙන ඇති කවර හෝ නිලධරයකු රාජකාරි සඳහා යාමට ගමන ආරම්භ කරන ස්ථානය ලෙස සැලකිය යුත්තේ නිලධරයාගේ ස්ථිර සේවා ස්ථානයයි. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු කැටුව යන රජයේ සේවකයකු නොවන සහායකයකුගේ කල්පිත සේවා ස්ථානය ලෙස සැලකිය යුත්තේ ද ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ සේවා ස්ථානයයි.

4.2 නිලධරයා තමන් පදිංචි නිවසෙහි සිට ගමන ආරම්භ කරන්නේ නම් හා එම නිවස ඔහුගේ සේවා ස්ථානයේ සිට කිලෝමීටර් 24 ක් ඇතුළත පිහිටා ඇත්නම් එකී නිවස ඔහුගේ කල්පිත රාජකාරි සේවා ස්ථානය සේ සලකා ගෙවීම් කළ හැකිය.

4.3 දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී වෙත කල් ඇතිව වාර්තා කරන ලෙස උපදෙස් ලබා දී ඇති නිලධාරීන්ට ඔහු විසින් තාවකාලික නවාතැන් ස්ථාන සපයනු ලැබේ. එම ස්ථානවල නොරැඳී වෙනත් ස්ථානයක නවාතැන් ගතහොත් එවැනි නිලධාරියකුට ගමන් ගාස්තු ගෙවිය හැක්කේ නවාතැන් ගැනීමට නියම කළ ස්ථානයේ සිට උපරිම වශයෙන් කිලෝමීටර් 07 ක දුරක් සඳහා පමණි.

4.4 I. මැතිවරණ රාජකාරි සඳහා හදිසි කැඳවීමක් නිසා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයකට කෙටි කාලයකින් වාර්තා කිරීමට සිදු වූයේ නම් එවැනි අවස්ථාවක දී නිලධරයකුට වායුසමනය කළ බස්රථයකින් ගමන යාමට සිදුවිය හැකිය. එවැනි අවස්ථාවක දී ගමන සඳහා වායුසමනය කළ බස් රථයෙන් නිකුත් කළ ප්‍රවේශ පත්‍රය ගමන් වියදම් වවුචරයට අමුණා ඉදිරිපත් කළහොත් වායුසමනය කළ බස්රථයට ගෙවූ ගාස්තුව ප්‍රතිපූරණය කළ හැකිය.

II. ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි සැතපුම් කුලී හිමි ක්ෂේත්‍ර නිලධරයකුට දිස්ත්‍රික්කය තුළ පමණක් යතුරුපැදිය පාවිච්චි කිරීම වෙනුවෙන් කිලෝමීටරයකට රු.2.00 බැගින් සැතපුම් කුලී ගෙවිය හැකි අතර මැතිවරණ රාජකාරි සඳහා තමාගේ යතුරුපැදිය පාවිච්චි කළ බව තහවුරු කෙරෙන ලියවිල්ලක් තමන් සේවය කළ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරයාගෙන් ලබාගෙන ගමන් වියදම් වවුචරය සමඟ ඉදිරිපත් කළ යුතුය.

4.5 I. ඡන්දපොළක ඡන්ද විමසීමේ රාජකාරිවල සේවයේ යෙදවීමට නියම කළ නිලධරයකු ඡන්ද විමසීමට පෙර දින රාත්‍රී තම ඡන්ද පොළෙහි හෝ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී නියම කළ ස්ථානයක නතරවීමට උපදෙස් ලැබ, ඇත්ත වශයෙන්ම එම ස්ථානයේ රාත්‍රිය ගත කළේ නම්, ගමන් කළ දුර ප්‍රමාණය නොසලකා ආයතන සංග්‍රහයේ සඳහන් ගාස්තු ප්‍රමාණය අනුව සම්පූර්ණ සංයුක්ත දීමනාව ගෙවිය හැකිය.

II. ඡන්ද පොළෙහි නතර නොවූ තැනැත්තෙකුට වුවද ගමන් කළ දුර ප්‍රමාණය කිලෝමීටර් 11.2කට/ සැතපුම් 07ට අඩුවන අවස්ථාවක දී දුර ප්‍රමාණය නොසලකා සංයුක්ත දීමනාවෙන් අඩක් ගෙවිය හැකිය.

III. ඡන්ද ගණන් කිරීමේ කාර්යයන් සඳහා ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයක රාත්‍රී රැඳී සිටි නිලධාරීන්ට ගමන් කළ දුර ප්‍රමාණය නොසලකා එදිනට පමණක් සංයුක්ත දීමනා ගෙවිය හැකිය.

4.6 ඡන්ද විමසීමට පෙර දින ඡන්ද පෙට්ටි නිකුත් කිරීමේ කාර්යයෙහි නියැලී නිලධාරීන්ට එම කාර්යය අවසන් කර නිවෙස් බලා යාමට කාල වේලාව ඇත. එහෙයින් එදින එම කටයුතුවල නිරත නිලධාරීන්ට සංයුක්ත දීමනා ගෙවිය හැක්කේ, එම කාර්යය සිදුකළ ස්ථානය ඔවුන්ගේ ස්ථිර සේවා ස්ථානය පිහිටි නාගරික බල ප්‍රදේශයෙන් බැහැරව පිහිටියේ නම් හා එම රාජකාරිවල යෙදුන ස්ථානය සංයුක්ත දීමනා ගෙවීම සඳහා ආයතන සංග්‍රහයේ සඳහන් දුරක පිහිටා ඇත්නම් නම් පමණි.

4.7 මැතිවරණ රාජකාරී සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් හෝ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරියා විසින් නියම කර ඇති දින හා වේලාවන්වලදී නිලධරයන් ගමන් කළ යුතුය. සංයුක්ත

දීමනා ගෙවනුයේ සම්පූර්ණයෙන්ම මෙම පදනම මත වන අතර එසේ නියම කර ඇති දින වකවානුව තුළට අයත් නොවන ගෙවීම් සඳහා අදාළ වන වියදම් ප්‍රතිපූර්ණය/ ප්‍රතිපාදන වෙන්කරනු නොලැබේ.

## 05. විශේෂ ගමන් ගාස්තු (සැතපුම් කුලී)

5.1 ප්‍රවාහන කටයුතු සම්බන්ධයෙන් 2024.11.12 දිනැති PE/2024/66 දරණ ප්‍රවාහන චක්‍රලේඛයේ (සියළුම ප්‍රවාහන චක්‍රලේඛයන්හි සාරාංශගත ප්‍රධාන චක්‍රලේඛය) සඳහන් උපදෙස් අනුව ගෙවීම් කළ යුතුය. එම උපදෙස්වලට පරිබාහිරව කටයුතු කර ඇති අවස්ථාවකදී ඒ සඳහා මගේ විශේෂ අනුමැතිය ලබාගත යුතුය.

5.2 I. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී/ ඔහු විසින් ප්‍රවාහන කටයුතු භාරව ක්‍රියා කිරීමට බලය පවරන ලද නිශ්චිත මාණ්ඩලික නිලධාරියෙකුගේ පූර්ව අනුමැතිය යටතේ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකු තම ඡන්දපොළ වෙත ඡන්ද පෙට්ටි ආදිය රැගෙන යාම සහ ඡන්ද විමසීමෙන් පසු ඒවා ආපසු රැගෙන ඒම සඳහා තමන් විසින්ම රැගෙන ආ වාහනයක් යොදවා ගනු ලැබී නම් PE/2024/47 හා 2024.10.24 දිනැති ප්‍රවාහන චක්‍රලේඛයේ මවිසින් සඳහන් කර ඇති කොන්දේසි හා උපදෙස්වලට යටත්ව පෙට්‍රල් වාහන සඳහා කිලෝමීටරයකට රු.52.00ක් හා ඩීසල් වාහන සඳහා කිලෝමීටරයකට රු.47.00 ක් බැගින් පෞද්ගලික වාහන සඳහා ගමන් ගාස්තු ගෙවිය හැකිය.

II. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා තමන් විසින් රැගෙන ආ වාහනය පැදවීමට යොදාගන්නා ලද රජයේ සේවයේ නොවන පෞද්ගලික රියදුරුට වැටුප වශයෙන් දිනකට රු.2,000.00ක් බැගින් ගෙවිය හැකිය. තවද දිනකට පැය 12ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අවස්ථාවන්හිදී රු.700.00 ක් බැගින් වූ සංයුක්ත දීමනා ද ගෙවිය හැකිය. මෙම දීමනාව ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන වවුචරය සමඟ V-3 ආකෘතියේ (ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති විසින් රැගෙන එන පෞද්ගලික වාහන තොරතුරු ඇතුලත් කර ඇති ආකෘතිය) පිටපත් ඉදිරිපත් කළ යුතුය. පෞද්ගලික රියදුරුගේ දීමනා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් රියදුරුට ගෙවා ඇති අවස්ථාවක දී එම මුදල ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ නමින් ප්‍රතිපූර්ණය කරනු ලැබේ. එම මුදල ප්‍රතිපූර්ණය කිරීම සඳහා රියදුරු විසින් තමාට හිමි මුදල භාරගත් බවට සහතිකයක්/ ලිපියක් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ වවුචරයට අමුණා ඉදිරිපත් කළ යුතුය.

III. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් රැගෙන එන ලද වාහනයක් මැතිවරණ රාජකාරී සඳහා යොදා ගත්තේ නම් එවැනි ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකුගේ ගමන් වියදම් ඉල්ලුම්පත හා මැතිවරණ රාජකාරිවලට අදාළ අනෙකුත් වවුචර් පැමිණීමේ සහතික ද සමඟ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය.

IV. ඡන්දපොළ රාජකාරී හැර වෙනත් මැතිවරණ රාජකාරී සඳහා සේවයේ යෙදවූ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට පෞද්ගලික වාහනයක් රැගෙන යාම වෙනුවෙන් සැතපුම් කුලිය ගෙවනු නොලැබේ.

5.3 I. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී ඔහු විසින් ප්‍රවාහන කටයුතු භාරව ක්‍රියා කිරීමට බලය පවරන ලද නිශ්චිත මාණ්ඩලික නිලධාරියෙකුගේ පූර්ව අනුමැතිය යටතේ ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරියෙකු/ නියෝජ්‍ය ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරියෙකු, ගණන් කිරීමේ සහකාර තේරීම්භාර නිලධාරියෙකු වශයෙන් පත්වීම් ලබා දී ඇති නිලධාරීන්ට <u>පෞද්ගලික වාහනය හෝ කලත්‍රයාගේ වාහනයක්</u> යොදවා ගැනීමට අවස්ථාව දී ඇත. තවද මෙම කාර්යය සඳහා විශේෂ හේතූන් මත අවිවාහක නිලධාරීන්ට තම පියා, මව, සොහොයුරු, සොහොයුරියන්ට අයත් වාහන ද විවාහක නිලධාරීන්ට තම පියා, මව, දූදරුවන් සතු වාහනද භාවිතා කළ හැකිය. එබැවින් එදින රැගෙන එනු ලබන පෞද්ගලික වාහනය පිළිබඳ තොරතුරු V-4 ආකෘතියෙන් සනාථ කෙරෙන්නේ නම් ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ සඳහන් ස්වකීය <u>නිත්‍ය හෝ කල්පිත</u> රාජකාරී සේවා ස්ථානය සේ සලකා එම පරිච්ඡේදයේ 8.2 පරිදි ඔවුන්ට පෙට්‍රල් වාහනයක් සඳහා

කිලෝමීටරයකට රු.12.00ක් හා ඩීසල් වාහන සඳහා කිලෝමීටරයකට රු.8.00ක් බැගින් ගෙවීම් කළ හැකිය.

II. ප්‍රමාණවත් තරම් වාහන නොමැති වීම නිසා ගම්පහ, කළුතර, කෑගල්ල හා පුත්තලම යන දිස්ත්‍රික්කවල කලාප රාජකාරි සඳහා පිටතින් පැමිණෙන සහකාර තේරීම්භාර නිලධාරීන්ගේ පෞද්ගලික වාහන යෙදවීමට අවසර දී තිබුණි. එලෙස තේරීම්භාර නිලධාරිගේ අනුමැතිය මත කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන් වශයෙන් ස්වකීය පෞද්ගලික වාහනයෙන් මැතිවරණ රාජකාරි ඉටු කළ සහකාර තේරීම්භාර නිලධාරීන්ට ද ඉහත 5.3.I අනුඡේදයෙහි සඳහන් ගෙවීම් කළ හැකිය. තවද කලාප රාජකාරි සඳහා රැගෙන යන වාහන යම් අවධානමකට මුහුණ දෙමින් මැතිවරණ රාජකාරීවල නිරත කරවීමට සිදුවන නිසා 5.3.III අනුඡේදයෙහි සඳහන් දීමනාවට අමතරව රුපියල් දහසක (රු.1,000.00) මුදලක් සම්පූර්ණ ධාවන කාලසීමාව සඳහා ගෙවිය හැකිය.

III. පෞද්ගලික වාහනය රැගෙන යනු ලැබූ ඉහත 5.3 I අනුඡේදයෙහි සඳහන් නිලධාරීන්ට වාහනය ධාවනය කළ <u>ස්වකීය නිත්‍ය සේවා ස්ථානයේ හෝ</u> <u>කල්පිත රාජකාරි සේවා ස්ථානයේ</u> සිට මැතිවරණ රාජකාරීවල නිරත වූ දිස්ත්‍රික්කයේ <u>ප්‍රධාන නගරයට</u> යාමට සහ නැවත පැමිණීම සඳහා වූ සම්පූර්ණ ගමනට දුර අනුව 5.3.1 හි සඳහන් දීමනාවට අමතරව පහත සඳහන් පරිදි විශේෂ දීමනාවක් ගෙවිය හැකිය. මෙම දීමනාව ලබා ගැනීම සඳහා වාහනය භාවිතා කළ නිලධරයා විසින් පොදු 35 වවුචරයක අත්සන් කර ගමන් වියදම් වවුචරය සමඟ ඉදිරිපත් කළ යුතුය.

| | | |
|---|---|---|
| අ. | සේවා ස්ථානය / කල්පිත රාජකාරි සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කය තුළ | රු. 1,500.00 |
| ආ. | ස්වකීය නිත්‍ය / කල්පිත සේවා ස්ථානයේ සිට මැතිවරණ රාජකාරීවල නිරත වූ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයට යාමට සහ නැවත පැමිණීම සඳහා වූ සම්පූර්ණ ගමනට දුර කි.මී. 100 දක්වා | රු. 2,600.00 |
| ඇ. | ස්වකීය නිත්‍ය / කල්පිත සේවා ස්ථානයේ සිට මැතිවරණ රාජකාරීවල නිරත වූ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයට යාමට සහ නැවත පැමිණීම සඳහා වූ සම්පූර්ණ ගමනට දුර කි.මී. 200 දක්වා | රු. 3,400.00 |
| ඈ. | ස්වකීය නිත්‍ය / කල්පිත සේවා ස්ථානයේ සිට මැතිවරණ රාජකාරීවල නිරත වූ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයට යාමට සහ නැවත පැමිණීම සඳහා වූ සම්පූර්ණ ගමනට දුර කි.මී. 300 දක්වා | රු. 4,200.00 |
| ඉ. | ස්වකීය නිත්‍ය / කල්පිත සේවා ස්ථානයේ සිට මැතිවරණ රාජකාරීවල නිරත වූ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයට යාමට සහ නැවත පැමිණීම සඳහා වූ සම්පූර්ණ ගමනට දුර කි.මී. 400 දක්වා | රු. 5,000.00 |
| ඊ. | ස්වකීය නිත්‍ය / කල්පිත සේවා ස්ථානයේ සිට මැතිවරණ රාජකාරීවල නිරත වූ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයට යාමට සහ නැවත පැමිණීම සඳහා වූ සම්පූර්ණ ගමනට දුර කි.මී. 500 දක්වා | රු. 5,800.00 |
| උ. | ස්වකීය නිත්‍ය / කල්පිත සේවා ස්ථානයේ සිට මැතිවරණ රාජකාරීවල නිරත වූ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයට යාමට සහ නැවත පැමිණීම සඳහා වූ සම්පූර්ණ ගමනට දුර කි.මී. 600 දක්වා | රු. 6,600.00 |
| ඌ. | ස්වකීය නිත්‍ය / කල්පිත සේවා ස්ථානයේ සිට මැතිවරණ රාජකාරීවල නිරත වූ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයට යාමට සහ නැවත පැමිණීම සඳහා වූ සම්පූර්ණ ගමනට දුර කි.මී. 700 දක්වා | රු. 7,400.00 |
| එ. | ස්වකීය නිත්‍ය / කල්පිත සේවා ස්ථානයේ සිට මැතිවරණ රාජකාරීවල නිරත වූ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයට යාමට සහ නැවත පැමිණීම සඳහා වූ සම්පූර්ණ ගමනට දුර කි.මී. 700 ට වැඩි | රු. 8,200.00 |

5.4 ප්‍රධාන ගණන් කිරීමේ නිලධරයකු, නියෝජ්‍ය ප්‍රධාන ගණන් කිරීමේ නිලධරයකු, ගණන් කිරීමේ සහකාර තේරීම්භාර නිලධරයකු හෝ කලාප භාර සහකාර තේරීම්භාර නිලධරයකු තම වාහනය සඳහා පෞද්ගලික රියදුරකු රැගෙන යාමට දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී/ ඔහු විසින් ප්‍රවාහන කටයුතු භාරව ක්‍රියා කිරීමට බලය පවරන ලද නිලධරයකු විසින් අවසර දී ඇත්නම් එම වාහනවල පෞද්ගලික රියදුරන්ට 5.2 II සඳහන් පරිදි දීමනා ගෙවිය හැකිය. එම ගෙවීම් ලබා ගැනීම සඳහා රියදුරුගේ නමින් වවුචරයක් පිළියෙල කර V-5 ආකෘතියේ (පෞද්ගලික වාහනය රැගෙන එන රියදුරුගේ පැමිණීමේ සහතිකය) පිටපතක් සමඟ ඉදිරිපත් කළ යුතු අතර එය රියදුරු සේවය කළ නිලධරයාගේ වවුචර් සමඟ ඉදිරිපත් කළ යුතුය. පෞද්ගලික වාහන රැගෙන යන්නන්ගේ රියදුරන්ගේ ගෙවීම් කිසිවක් නිලධරයාගේ නමින් ප්‍රතිපූර්ණය කරනු නොලැබේ. පෞද්ගලික රියදුරුගේ දීමනා සඳහා රියදුරුගේ නමට ලියන ලද චෙක්පතකින් පමණක් ගෙවිය යුතුය.

5.5 මෙසේ පෞද්ගලික මෝටර් රථය පාවිච්චි කිරීම වෙනුවෙන් ගෙවීම් කළ හැක්කේ සැතපුම් කුලී හිමි නිලධාරීන්ට පමණක් වන අතර, ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ සඳහන් සියළු නියමයන්ට හා සීමාවන්ට යටත්වය.

5.6 I. මැතිවරණ රාජකාරි සඳහා සේවයේ යෙදවූ වෙන් කළ වාහන සඳහා නියමිත දිස්ත්‍රික්කයට යාමට/ ඒමට අවශ්‍ය ඉන්ධන සඳහා වැයවූ මුදල් ප්‍රතිපූර්ණය කිරීම පිණිස හඳුන්වා දී ඇති AV-01 ආකෘතිය හා පොදු 35 වවුචරයක් සම්පූර්ණ කර එහි පිටුපස අත්සන් තබා අදාළ බිල්පත කොළඹ දිස්ත්‍රික්කයෙන් යන නිලධාරීන් රාජගිරියේ පිහිටි මැතිවරණ කොමිෂන් සභාව වෙත ද වෙනත් දිස්ත්‍රික්වලින් රාජකාරි සඳහා වාර්තා කරන නිලධාරීන් තම ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කිරීමට වාහනය අයත් කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කයේ මැතිවරණ කාර්යාලය වෙත ද ඉදිරිපත් කිරීමෙන් නිලධරයා නමින් එම වියදම ප්‍රතිපූර්ණය කරවා ගත යුතුය.

II. සංචිත වාහනවලට ලබාගත් ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කිරීමට හඳුන්වා දී ඇති PV-01 ආකෘතිය සම්පූර්ණ කර මැතිවරණ කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමෙන් එම ඉන්ධන වියදම අදාළ ආයතනය නමින් ප්‍රතිපූර්ණය කර ගත යුතුය.

5.7 මැතිවරණ රාජකාරි සඳහා පුද්ගලික වාහනය රැගෙන යාමට/ ඒමට අවසර දී ඇති නිලධාරීන් ගමන සඳහා අධිවේගී මාර්ගය භාවිතා කළේ නම් එම ගාස්තුව ප්‍රතිපූර්ණය කළ හැකිය. ඒ සඳහා අදාළ ප්‍රවේශ පත්‍රයේ සහතික කළ ඡායා පිටපතක් ගමන් වියදම් වවුචරයට අමුණා ඉදිරිපත් කළ යුතුය.

## 06. රජයේ සේවයේ නොවන සේවකයින් සඳහා ගෙවීම්

6.1 ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති විසින් සේවයෙහි යොදවනු ලබන රජයේ සේවකයෙකු නොවන සහායකයකුට ඡන්ද විමසීමට අදාළ මුළු කාර්යය සඳහා මෙහි 7.1 හි සඳහන් කාර්යාල සේවක සේවයේ දීමනාව ගෙවිය හැකිය.

6.2 එවැනි සේවකයෙකුට ආයතන සංග්‍රහයේ සඳහන් පරිදි දිනක අවම සංයුක්ත දීමනාව වූ රු.700.00 බැගින් අදාළ දින ගණන සඳහා සංයුක්ත දීමනාව ගෙවිය හැකිය. එලෙස සේවකයකු මැතිවරණ රාජකාරි සඳහා කැටුව ගියේ නම් එම ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් සේවකයාට හිමි මුදල ගෙවා එම මුදල ප්‍රතිපූර්ණය කර ගත හැකිය.

6.3 සහකාර තේරීම්භාර නිලධරයකුට ස්වකීය මැතිවරණ රාජකාරි ගමනේ දී කාර්යාල සේවක සේවකයකු හෝ වෙනත් අයෙකු රැගෙන යාම සඳහා අවසර දී නොමැති බැවින් සහකාර තේරීම්භාර නිලධරයකු කැටුව යන සහායකයින් සඳහා ගෙවීම් නොකළ යුතුය.

## 7. දීමනා

7.1 දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී විසින් ලිඛිත පත්වීමක් කරනු ලැබ මැතිවරණ රාජකාරිවල නිරත වූ නිලධරයකු/ සේවකයකු පහත සඳහන් පරිදි වූ පැමිණීමේ සහතිකයකින් ඒ බව සනාථ කරන්නේ නම් ඔවුනට එක් එක් කාර්යයන් සඳහා පහත පරිදි දීමනා ගෙවිය හැකිය.

| කාර්ය මණ්ඩලය | ගෙවිය යුතු දීමනාව රු. | පැමිණීමේ සහතිකයේ අංකය |
|---|---|---|
| කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන් සඳහා | 6,000.00 | CE 46 |
| ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් සඳහා* | 6,000.00 | CE 19/1 |
| අතිරේක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් සඳහා | 5,000.00 | CE 19 |
| විශේෂ/අතිරේක කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් සඳහා | 3,500.00 | CE 19 |
| කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්/ ලිපිකරුවන් සඳහා | 3,250.00 | CE 19 |
| කාර්යාල කාර්ය සහායකයින් සඳහා | 3,000.00 | CE 19 |

* ඡන්දපොළ රාජකාරි කළ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට පමණක් කෙටි පණිවුඩ යැවීම වෙනුවෙන් සන්නිවේදන ගාස්තු වශයෙන් රු.100.00ක මුදලක් ඔවුන්ගේ ඡන්දපොළ දීමනාවට එකතුකර ගෙවිය යුතුය.

7.2 ඡන්ද පෙට්ටි නිකුත් කිරීම සඳහා CE47 දරණ මුද්‍රිත ආකෘතියේ වූ පැමිණීමේ සහතිකයකින් සනාථ කෙරෙන්නේ නම් ඡන්ද විමසීමට පෙර දින ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් වෙත ඡන්ද පෙට්ටි හා ඡන්ද පත්‍රිකා ආදිය නිකුත් කිරීමේ යෙදුන නිලධාරීන්ට හා ඡන්ද පෙට්ටි ආපසු භාර ගැනීම සඳහා CE48 දරණ මුද්‍රිත ආකෘතියේ වූ පැමිණීමේ සහතිකයකින් සනාථ කෙරෙන්නේ නම් ඡන්ද විමසීමේ දින පස්වරුවේ ඡන්ද පෙට්ටි ආදිය ආපසු භාර ගැනීමේ යෙදුනා වූ නිලධාරීන්ට එම එක් එක් දින කාර්යය සඳහා පහත සඳහන් පරිදි ගෙවීම් කළ හැකිය.

| කාර්ය මණ්ඩලය | නිකුත් කිරීම රු. | භාර ගැනීම රු. |
|---|---|---|
| සහකාර තේරීම්භාර නිලධාරි | 2,000.00 | 3,000.00 |
| ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති | 1,600.00 | 2,400.00 |
| කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති / ලිපිකරු | 1,250.00 | 1,750.00 |
| කණිෂ්ඨ සේවක | 1,000.00 | 1,500.00 |

CE 47 හෝ CE 48 දරණ මුද්‍රිත ආකෘතියේ වූ පැමිණීමේ සහතික හැර වෙනත් ආකෘති අනුව පැමිණීමේ සහතික ඉදිරිපත් කරන නිලධාරීන්ට මෙම දීමනා නො ගෙවිය යුතුය.

7.3 නිලධාරියෙකුට ගෙවිය හැක්කේ 7.1 හෝ 7.2 හි සඳහන් දීමනාවන් අතුරින් එකක් පමණි. එහෙත් අවශ්‍ය නිලධාරීන් ප්‍රමාණවත් නොවීම නිසා හෝ විශේෂ අවස්ථාවක දී මෙම කාර්යය ඉටුකර ඇති නිලධරයෙකු වෙනත් කාර්යයක් ඉටුකළේ නම් ඊට අදාළ පත්වීම් ලිපිය හා පැමිණීමේ සහතිකය අනුව අදාළ ගෙවීම් කළ හැකි වුවද, ඒ සඳහා නිලධරයා මැතිවරණ රාජකාරී ඉටුකළ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්ගේ සහතිකය මත අදාළ ගෙවීම කළ යුතුය.

7.4 ඡන්ද ගණන් කිරීමේ හා ප්‍රතිඵල ප්‍රකාශ/ වගුගත කිරීමේ කාර්යයන්ට පමණක් යොදවා ගනු ලැබූ නිලධාරීන්ට ඉහත 7.1 හෝ 7.2 හි සඳහන් දීමනා නො ගෙවිය යුතුය.

7.5 දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී විසින් ලිඛිතව පත්වීමක් කරනු ලැබ ඡන්ද ගණන් කිරීමේ රාජකාරීවල නිරත වූ නිලධරයකු/ සේවකයකු පහත සඳහන් පරිදි වූ පැමිණීමේ සහතිකයකින් ඒ බව සනාථ කරන්නේ නම් ඔවුනට එක් එක් කාර්යයන් සඳහා පහත පරිදි දීමනා ගෙවිය හැකිය. ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී දීමනාව ගෙවීමට PE-6 ආකෘතියේ වූ පත්වීමක් ලැබ තිබිය යුතුයි.

| කාර්ය මණ්ඩලය | දීමනාව රු. | පැමිණීමේ සහතිකයේ අංකය |
|---|---|---|
| ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරි | 15,000.00 | CE 50 |
| නියෝජ්‍ය ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරි | 12,000.00 | CE 54 |
| සහකාර තේරීම්භාර නිලධාරි | 10,000.00 | CE 49 |
| ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති | 6,000.00 | CE 49 |
| කණිෂ්ඨඡන්ද ස්ථානාධිපති/ලිපිකරු | 4,000.00 | CE 49 |
| කාර්යාල කාර්ය සහායක | 3,000.00 | CE 49 |

7.6 දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරි විසින් ලිඛිත පත්වීමක් කරනු ලැබ ප්‍රතිඵල වගුගත කිරීමේ/ ප්‍රකාශ කිරීමේ රාජකාරිවල නිරත නිලධාරීන්ට CE 55 පැමිණීමේ සහතිකයෙන් සනාථ වන්නේ නම් ඉහත 7.5 යටතේ වූ වගුවේ සඳහන් පරිදි එක් එක් නිලධරයා/ සේවකයාගේ මැතිවරණ රාජකාරියට අදාළ තනතුර අනුව හිමි දීමනාව ගෙවිය හැකිය.

7.7 දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරි විසින් ලිඛිත පත්වීමක් කරනු ලැබ **CE 52** දරණ මුද්‍රිත ආකෘතියේ වූ පැමිණීමේ සහතිකයකින් සනාථ කෙරෙන්නේ නම් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කාර්යාලයක (ඡන්ද ප්‍රදේශ මට්ටමින්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පිහිටුවනු ලැබූ කාර්යාලයක) සේවය කළ සහකාර තේරීම්භාර නිලධාරි/ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති/ කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති/ ලිපිකරු හෝ කාර්යාල කාර්ය සහායක ට ගෙවනු ලබන දීමනාව ඔවුන් සේවය කරන මැතිවරණ කාර්යාලයෙන් ගෙවන ලෙස නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ට විශේෂ උපදෙස් ලබාදී ඇත.

7.8 CE 53 දරණ මුද්‍රිත ආකෘතියේ වූ පැමිණීමේ සහතිකයකින් සනාථ කෙරෙන්නේ නම් පමණක් ඡන්ද විමසීම හා ගණන් කිරීම සම්බන්ධිත කමිටුවල (සුභසාධන/ ප්‍රවාහන/ පොදු පහසුකම් කමිටු වැනි) රාජකාරී සඳහා ඔවුන්ව පත්කර ඇති තනතුරු අනුව 7.2 හා 7.5 හි සඳහන් දීමනා ඔවුන් සේවය කළ මැතිවරණ කාර්යාලයෙන් ගෙවන ලෙස නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ට විශේෂ උපදෙස් ලබා දී ඇත.

7.9 CE 56 දරණ මුද්‍රිත ආකෘතියේ වූ පැමිණීමේ සහතිකයකින් සනාථ කෙරෙන්නේ නම් පමණක් ශාලා සම්බන්ධීකරණ කාර්යය මණ්ඩලය සඳහා දීමනාවක් ගෙවිය හැකිය. මෙම දීමනාව ඔවුන් සේවය කළ මැතිවරණ කාර්යාලයෙන් ගෙවන ලෙස නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ට විශේෂ උපදෙස් ලබා දී ඇත.

**[සැලකිය යුතුයි : 7.7, 7.8 සහ 7.9 හි සඳහන් දීමනා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල මඟින් ගෙවීමට උපදෙස් දී ඇති බැවින් පොදු 35 වවුචරයක නිලධරයාගේ නම හා ඉටුකළ කාර්යය පිළිබඳව සඳහන් කර එහි පිටුපස අත්සන් තබා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත වවුචර් භාරදෙන ලෙස ඔබ කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන්ට උපදෙස් දිය යුතුය. CE 52, CE 53 සහ CE 56 ආකෘතිවල වූ පැමිණීමේ සහතිකවලට අදාළ දීමනා තම ස්ථිර සේවා ස්ථානයෙන් නොගෙවිය යුතු අතර එවැනි ගෙවීම් ප්‍රතිපූර්ණය කරනු නොලැබේ.]**

7.10 මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් මත විශේෂයෙන් පවරන ලද මැතිවරණ රාජකාරි ඉටුකළ නිලධාරීන් සිටී නම් එවැනි තැනැත්තන්ට ගෙවිය යුතු දීමනා සඳහා අදාළ වවුචර් එම විශේෂ රාජකාරී ඉටුකළ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමට උපදෙස් දී ඇති බැවින් ඒ අනුව කටයුතු කරන ලෙස ඔබගේ නිලධාරීන්ට උපදෙස් දිය යුතුය.

7.11 රජයේ සේවයේ නියුතු රියදුරන්ට හැර ඉහත සඳහන් 7.1, 7.2 හා 7.5 අනු ඡේද යටතේ සඳහන් දීමනා ලබා ගන්නා නිලධාරීන්ට හා සේවකයන්ට එම කාලසීමාව සඳහා අතිකාල හෝ නිවාඩු දින වැටුප් නොගෙවිය යුතුය.

**08. රජයේ වාහනවල රියදුරන්ට ගෙවීම්**

8.1 මැතිවරණ කොමිෂන් සභාවේ හෝ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගේ ඉල්ලීම පරිදි නොවැම්බර් මස 11 වෙනි දින සිට නොවැම්බර් මස 17 දින දක්වා (එම දෙදින ද ඇතුලත්ව) සීමාව තුළ පමණක් ඡන්ද විමසීමට අදාළ රාජකාරිවල යොදවන ලද වාහනවල රියදුරන්ට CE 51 දරණ මුද්‍රිත ආකෘතියේ වූ පැමිණීමේ සහතිකයකින් සනාථ වන්නේ නම් රජයේ කාර්යාල/ ආයතනවල ස්ථිර සේවයේ නිරත රියදුරන්ගේ අතිකාල, ගමන් වියදම් හා සංයුක්ත දීමනා ඔවුන්ගේ ස්ථිර සේවා ස්ථානයෙන් ගෙවිය යුතු අතර, රාජගිරියේ පිහිටි මැතිවරණ කොමිෂන් සභාව වෙතින් එම ගෙවීම් ප්‍රතිපූර්ණය/ ඊට අදාළ ප්‍රතිපාදන වෙන්කරනු ලැබේ.

8.2 එසේ වුවද මැතිවරණ රාජකාරිවලට අදාළව සේවයේ යෙදුන පහත සඳහන් රියදුරන්ගේ ගෙවීම් සඳහා වූ වවුචර් ඔවුන් සේවය කළ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය.

I. <u>නොවැම්බර් මස 11 වෙනි දින සිට නොවැම්බර් මස 17 දින දක්වා</u> වූ දින 07 ක කාලසීමාවෙන් බැහැර වූ දිනයන්හි දී මැතිවරණ කටයුතුවලට අදාළව සේවයේ නිරතව ඇති රියදුරන්ගේ සියළුම ගෙවීම්

II. <u>දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි රියදුරන් හා එම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් වැටුප් ලබන වෙනත් රජයේ කාර්යාලවල රියදුරන්ගේ ගෙවීම්</u>

III. <u>ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි රියදුරන් හා එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් වැටුප් ලබන වෙනත් කාර්යාලවල රියදුරන්ගේ ගෙවීම්</u>

ඉහත 8.2 අනුඡේදය යටතේ දක්වා ඇති කාණ්ඩවලට අයත්වන රියදුරන් සඳහා තම ස්ථිර සේවා ස්ථානවලින් ගෙවීම් නොකළයුතු අතර එවැනි ගෙවීම් ප්‍රතිපූර්ණ/ ප්‍රතිපාදන ලබාගැනීම සඳහා කරන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.3 මැතිවරණ දිනවල වුව ආරක්ෂක අවශ්‍යතාව සඳහා සේවයේ යොදවන ලද නිලධාරීන්ගේ දීමනා සහ පොලිස් ස්ථානවල සේවයේ යොදවන ලද වාහනවල රියදුරන්ට දීමනා, අතිකාල හා ගමන් වියදම් ගෙවීම ආරක්ෂක අමාත්‍යංශය හා පොලිස් දෙපාර්තමේන්තුව වෙත වෙන් කරන ප්‍රතිපාදනවලින් එම ආයතන විසින් ගෙවනු ලබන හෙයින් එවැනි ගෙවීම් ඔබ විසින් සිදු නොකළ යුතුය.

8.4 මැතිවරණ රාජකාරිවල යෙදවූ රියදුරු මහතුන් සඳහා පොරොත්තු සේවා වෙනුවෙන් ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 6.2 උප වගන්තිය අනුව අතිකාල ගෙවිය යුතුය.

**09. මැතිවරණ උපදෙස් පන්තිවලට සහභාගීවීම සඳහා ගෙවීම්**

9.1 නිලධාරීන්ට වියදමක් නොමැතිව සහභාගීවීමට හැකි වන පරිදි උපදෙස් පන්ති පැවැත්වීමට සියළු උත්සාහයන් ගෙන ඇත. කෙසේ වුවද, උපදෙස් පන්තිවලට සහභාගිවීම සඳහා දරණ ලද ගමන් වියදම් ලබා ගැනීමට අපේක්ෂා කරන නිලධාරීන් ඒ සඳහා තම ගමන් වියදම් වවුචර් උපදෙස් පන්ති සඳහා කැඳවීම් සිදුකළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය. උපදෙස් පන්ති පවත්වනු ලැබුවේ රාජගිරිය මැතිවරණ කොමිෂන් සභාවේ කැඳවීම මත නම් ඒ සඳහා වූ ගමන් වියදම් වවුචර් රාජගිරියේ පිහිටි මැතිවරණ කොමිෂන් සභාවේ අතිරේක/ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (පාලන) වෙත ඉදිරිපත් කළ යුතුය.

9.2 උපදෙස් පන්තිවලට යාම සඳහා කුලී මෝටර් රිය ගාස්තු හෝ ඉල්ලා ගත් වාහනවලට ගමන් ගාස්තු/ සැතපුම් කුලී ගෙවනු නො ලැබේ. තම පෞද්ගලික/ කලත්‍රයාගේ වාහනය ඒ සඳහා භාවිතා කළ බව උපදෙස් පන්ති පැවැත්වීම සඳහා කැඳවීම් කළ මාණ්ඩලික නිලධරයා විසින් නිකුත් කළ විධිමත් සහතිකයකින් සනාථ කළහොත් පමණක් පෞද්ගලික වාහනය සඳහා ගමන් ගාස්තු/ සැතපුම් කුලී ගෙවිය හැකිය. උපදෙස් පන්තියට සහභාගී වූ නිලධරයා එම කාර්යයට පාවිච්චි කළ වාහනය පෙට්‍රල් වාහනයක් ද, ඩීසල් වාහනයක්ද යන වග ගෙවීම් කරන නිලධරයා විසින් ගෙවීම් කිරීමට පෙර තහවුරු කර ගත යුතුය.

9.3 උපදෙස් පන්තිවලට සහභාගි වූ නිලධාරීන්ට ගෙවීම් කිරීම සඳහා මුදල් වෙන් කර දෙන ලෙස ආයතන ප්‍රධානීන් නොඉල්ලිය යුතුය. එසේම උපදෙස් පන්ති සඳහා සහභාගී වූවන්ට තම ස්ථිර සේවා ස්ථානයෙන් ගෙවීම් කර එම මුදල් ප්‍රතිපූර්ණය කරන ලෙස මැතිවරණ කොමිෂන් සභාවෙන් හෝ දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ගෙන් ඉල්ලීම් නොකළ යුතුය.

9.4 උපදෙස් පන්තිවලට සහභාගීවීම වෙනුවෙන් ගමන් වියදම් හා සංයුක්ත දීමනා හැර නිවාඩු දින වැටුප් හෝ අතිකාල දීමනා ගෙවනු නො ලැබේ.

**10. තම ස්ථිර සේවා ස්ථානයෙන් සිදු කරන ලද ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීමට/ ප්‍රතිපාදන ලබාදීමට ඉදිරිපත් කළයුතු උපලේඛන**

10.1 මෙම චක්‍රලේඛය අනුව තම ස්ථිර සේවා ස්ථානවලින් ගෙවීම් කළ නිලධාරීන්ගේ විස්තර (රියදුරන්ගේ හැර) අමුණා ඇති "ඒ" ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද උපලේඛනයක් මඟින් මැතිවරණ කොමිෂන් සභාව වෙත එවීමෙන් එම මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට/ ඊට අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට හැකිය.

10.2 මෙහි 8.1 අනුඡේදය යටතේ රජයේ වාහනවල රියදුරන්ට අතිකාල, ගමන් වියදම් හා සංයුක්ත දීමනා ගෙවීම් පිළිබඳ විස්තර අමුණා ඇති "බී" ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද උපලේඛනයක් මඟින් මැතිවරණ කොමිෂන් සභාව වෙත එවීමෙන් එම ගෙවීම් ප්‍රතිපූර්ණය කර ගැනීමට/ ඊට අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට හැකිය.

10.3 ඉහත කී උපලේඛන සමඟ ගෙවීම් වවුචර්වල මුල් පිටපත් මැතිවරණ කොමිෂන් සභාව වෙත නොඑවිය යුතුය. ඒවා ගෙවීම් කළ ආයතනයේ විගණන අවශ්‍යතාව සඳහා තබා ගත යුතුය.

10.4 ගෙවීම් උපලේඛන පමණක් මෙම කාර්යාලයට ඉදිරිපත් කළ යුතු අතර ද්විත්ව ගෙවීම් වැළැක්වීම සඳහා එක් උපලේඛනයකට ඇතුලත් කළ නම් නැවත නැවතත් ඇතුළත් නොකළ යුතුය. තවද ෆැක්ස් මඟින් එවන උපලේඛනවලට ගෙවීම් කරනු නො ලැබේ.

10.5 මේ සමඟ අමුණා ඇති "ඒ" හා "බී" ආදර්ශ ආකෘතිපත් අනුව අපේක්ෂිත තොරතුරු සම්පූර්ණව හා නිවැරදිව සැපයිය යුතුය. එසේම නිලධාරීන්ට ගෙවනු ලබන විවිධ දීමනා වෙන් වෙන් වශයෙන් අදාළ ආකෘති පත්‍රයේ අදාළ තීරුවල නිවැරදිව සඳහන් කළ යුතුය. අසම්පූර්ණ හෝ සදොස් තොරතුරු ඉදිරිපත් කරනු ලබන අවස්ථාවල දී විමසීම් කිරීමට හා නිවැරදි තොරතුරු සොයා බැලීමට සිදුවන හෙයින් එවැනි ගෙවීම් ප්‍රමාද විය හැකිය.

10.6 අමාත්‍යාංශ හා රජයේ දෙපාර්තමේන්තුවල නිලධාරීන්ට එම කාර්යාලවල අක්මුදල් මඟින් ද, සංස්ථා, පළාත් පාලන ආයතන වැනි රජයේ වෙනත් කාර්යාලවල නිලධාරීන්ට එම ආයතනවල අරමුදල් මඟින් ද මෙම ගෙවීම් කළ හැකිය.

**11. ප්‍රතිපූර්ණය කිරීමට හෝ ප්‍රතිපාදන ලබාදීමට අදාළ උපලේඛන සකස් කිරීම**

11.1 ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන්, නියෝජ්‍ය ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන්, කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන්, ඡන්ද පෙට්ටි නිකුත් කිරීම හා භාර ගැනීම, ගණන් කිරීම භාර සහකාර තේරීම්භාර නිලධාරීන්, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්, අතිරේක ජ්‍යෙෂ්ඨ ඡන්ද

ස්ථානාධිපතිවරුන්, කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්, විශේෂ කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්, ලිපිකරුවන් හා කාර්යාල සේවක සේවකයින්න් වශයෙන් සේවය කළ කාර්යය මණ්ඩලයට කරන ලද ගෙවීම් විස්තර මේ සමඟ අමුණා ඇති "ඒ" ආකෘතියෙහි නිවැරදිව ඇතුලත් කර ඉදිරිපත් කළ යුතුය.

11.2 ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු විසින් ඡන්දපොළ කටයුතු සඳහා කාර්යාල සේවක සේවකයකු වශයෙන් රජයේ සේවයේ නොවන සහායකයකු සේවයේ යොදා ගෙන ඇති අවස්ථාවක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා නමින් එම සහායකගේ ගමන් වියදම් සංයුක්ත දීමනා හා ඡන්දපොළ දීමනා ලබා ගත්තේ නම් එම ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ නම ඉදිරියේ සහායකගේ ගමන් වියදම් හා සංයුක්ත දීමනා "ඒ" ආකෘතියේ 12 වන තීරුවෙහි ඇතුලත් කර මැතිවරණ කාර්යය වෙනුවෙන් වූ දීමනා පමණක් 13 වන තීරුවෙහි දැක්විය යුතුය.

11.3 තම නිත්‍ය රාජකාරි සඳහා වාහනයක් (Assigned Vehicle) වෙන් කර ඇති නිලධරයකු මැතිවරණ රාජකාරි සඳහා එම වාහනය රැගෙන ගොස් ඇති අවස්ථාවන්හි දී එම වාහනය පැදවූ රජයේ සේවයේ රියදුරුට කරන ලද ගෙවීම් "බී" ආකෘතියෙහි සඳහන් කළයුතු අතර එම රියදුරුගේ නම ඉදිරියෙන් 5 වන තීරුවෙහි වාහනය මැතිවරණ රාජකාරි සඳහා රැගෙන ගිය මාණ්ඩලික නිලධරයාගේ නම සඳහන් කළ යුතුය. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී වෙත වාර්තා කළ සංචිත වාහනයක් (Pool Vehicle) නම් 5 වෙනි තීරුව හිස්ව තැබිය යුතුය.

11.4 ප්‍රතිපූර්ණය සඳහා ඉදිරිපත් කරනු ලබන උපලේඛනයේ ප්‍රතිපූර්ණ චෙක්පත ලිවිය යුතු ආකාරය ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සඳහන් කළ යුතුය.

## 12. ගෙවීම් කඩිනම් කිරීම සඳහා කාර්යාලයීය නිලධාරීන්ට ගෙවන දීමනා

12.1 සියළුම නිලධාරීන්ගේ ගමන් වියදම්, අතිකාල හා දීමනා ඡන්ද විමසීමේ දින සිට දින 60 ක් ඇතුලත ගෙවා අවසන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

12.2 මැතිවරණ රාජකාරි සඳහා නිලධාරීන් විශාල පිරිසක් සේවයේ යෙදවීමට සිදු වූ කාර්යාලවල කාර්යය මණ්ඩලයට හිමි දීමනා ඉක්මණින් ලබා ගැනීම පහසු කරවීම සඳහා අදාළ වවුචර් පරීක්ෂා කිරීම, සහතික කිරීම, උපලේඛනගත කිරීම, චෙක්පත් ලිවීම, ගෙවීම හා ගිණුම් තැබීම යනාදී සියළුම කාර්යයන් හි යෙදෙන කාර්යාලයීය නිලධාරීන්ට දිරිදීමනාවක් ගෙවීමට හැකිවන පරිදි මුදල් සපයා දෙනු ලැබේ.

12.3 මෙම චක්‍රලේඛයට අමුණා ඇති "ඒ" හා "බී" ආකෘති අනුව සකස් කළ මැතිවරණ කාර්යය මණ්ඩල ගෙවීම් උපලේඛන නිවැරදිව හා ඉක්මණින් රාජගිරියේ පිහිටි මැතිවරණ කොමිෂන් සභාවවෙත ඉදිරිපත් කිරීම සැලකිල්ලට ගෙන 12.2 හි සඳහන් දිරි දීමනාව ගෙවීම සඳහා ප්‍රතිපූර්ණය/ ප්‍රතිපාදන වෙන්කරනු ලබන අවස්ථාවේ දී අතිරේක මුදලක් ඔබ වෙත සපයා දෙනු ලැබේ.

12.4 කෙසේ වුවද, ඡන්ද විමසීමේ දින සිට දින 60 ඉක්ම වූ පසුව රාජගිරියේ පිහිටි මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන උපලේඛන සඳහා ද, මෙම උපදෙස්වලින් බැහැර වෙමින් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත ඉදිරිපත් කරන උපලේඛන සඳහා ද, සකස් කිරීමේ දෝෂ, යතුරු ලිවීමේ දෝෂ, එකතු කිරීමේ දෝෂ සහිතව ඉදිරිපත් කරන උපලේඛන සඳහා ද නිලධාරීන් 10 කට අඩු සංඛ්‍යාවකගේ ගෙවීම් ඇතුළත් උපලේඛන සඳහා ද ඉහත කී අතිරේක මුදල් සපයනු නො ලැබේ.

12.5 මෙම කාර්යාලය වෙතගෙවීම් උපලේඛන එවීමට පෙර එමගින් ඉල්ලා ඇති සියළු විස්තර නිවැරදිව ඇතුළත්ව තිබේදැයි පරීක්ෂා කර බලන ලෙස ද, ගෙවිය යුතු මුදල් ප්‍රමාණ පිළිබඳ විස්තර යතුරු ලිවීමෙන් පසු නැවත එකතු කර බලන ලෙස ද ඉල්ලා සිටින අතර <u>එම ආකෘතිපත් පිටු කිහිපයකින් සමන්විත වන්නේ නම් සෑම පිටුවකම අග උප එකතුව හා සියළුම පිටුවල උප එකතුන් අවසාන පිටුවේ අගට මුළු එකතුව ලෙස යෙදිය යුතුය.</u> එසේම ආදර්ශ ආකෘතියේ පරිදි <u>නිලධාරීන් සංඛ්‍යාව ගණනය කර ගැනීම සඳහා නිලධාරීන්ගේ නම් ඉදිරියෙන් අනු අංකය</u>

සඳහන් කිරීම අනිවාර්ය වේ. ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීමෙන් පසු හෙළිදරව් වන සටහන් කිරීමේ හා යතුරු ලිවීමේ දෝෂ සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව දැනුවත් කිරීම අවශ්‍ය නොවන අතර අඩු වී ඇති මුදල් ප්‍රමාණ ඉහත සඳහන් ගෙවීම් කාර්ය මණ්ඩලයට වෙන් කරන මුදලින් හිලව් කර ගත යුතුය.

**13.** වෙනත් කරුණු

13.1 මෙම චක්‍රලේඛයෙහි සඳහන් උපදෙස් පරිදි මැතිවරණ රාජකාරිවල නිරත වූ කාර්යය මණ්ඩලයට හිමි දීමනා ලබා ගැනීම සඳහා වවුචර් සකස් කර කඩිනමින් ඉදිරිපත් කරන ලෙස ඔබගේ නිලධාරීන් හා සේවක මහතුන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

13.2 නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් විසින් කරනු ලබන ගෙවීම් ඡන්ද විමසීම අවසන් වී දින 60ක් තුළ හෝ ඊට පෙර ගෙවා අවසන් කරනු ලබන හෙයින් නියම කර ඇති කාලසීමාව තුළ ගෙවීම් වවුචර් ඉදිරිපත් නො කළහොත් ඔවුනට අදාළ දිරි දීමනා ලබාගත නොහැකි වනු ඇත.

13.3 ප්‍රතිපූර්ණය කිරීම/ ප්‍රතිපාදන වෙන්කිරීම පිණිස කෙරෙන ඉල්ලීම් කඩිනමින් රාජගිරියේ පිහිටි මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර එම ඉල්ලීම් අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීට හෝ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්ට ඉදිරිපත් නොකළ යුතුය.

13.4 මුදල් ප්‍රතිපූර්ණය/ ප්‍රතිපාදන වෙන්කිරීම සඳහා ඉදිරිපත් කරන උපලේඛන ලද වහාම ඒ බව දැනුම්දීමට ක්‍රියා කරනු ලැබේ. ඊට පිළිතුරක් නොලදහොත් එම ලිපි අස්ථානගතවීමක් ලෙස සැලකිය යුතු අතර, ඒ පිළිබඳව ලියාපදිංචි තැපෑලෙන් මා වෙත වාර්තා කළ යුතුය.

13.5 ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන උපලේඛන (AV-01 සහ PV-01 ආකෘති) පරීක්ෂා කිරීම මෙම කොමිෂන් සභාවේ ප්‍රවාහන අංශයෙන් සිදුකරනු ලැබේ. එහෙයින් එම ප්‍රතිපූර්ණය කිරීම් පිළිබඳව කරන සියළුම විමසීම් සඳහා ප්‍රවාහන අංශය භාර මාණ්ඩලික නිලධරයා [අතිරේක මැතිවරණ කොමසාරිස් (පාලන)] අමතා අවශ්‍ය තොරතුරු ලබා ගත හැකිය.

13.6 ඉහත කී උපදෙස් පරිදි උපලේඛන ඉදිරිපත් කර ප්‍රතිපූර්ණය/ ප්‍රතිපාදන වෙන්කර නොගන්නා ගෙවීම් පිළිබඳව සම්පූර්ණ වගකීම ගෙවීම් කළ නිලධරයා වෙත පැවරෙන බවත්, නියමිත දිනට ප්‍රතිපූර්ණය/ ප්‍රතිපාදනවෙන්කර නො ගන්නා ගෙවීම් සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වගකීම භාර නොගන්නා බවත් කාරුණිකව දන්වමි.

13.7 2024.11.14 දින පැවැති පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව නිකුත් කර ඇති මෙම කාර්යය මණ්ඩල ගෙවීම් චක්‍රලේඛය හා ප්‍රවාහන කටයුතු සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා අදාළ ආකෘති මැතිවරණ කොමිෂන් සභාවේ www.elections.gov.lk වෙබ් අඩවියට පිවිස ලබා ගත හැකි බව කාරුණිකව දන්වමි.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්
මැතිවරණ කොමිෂන් සභාව

පිටපත් :
01. විගණකාධිපති
02. ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන්
03. දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්

} දැන ගැනීම පිණිස හා මෙම චක්‍රලේඛයේ උපදෙස් අනුව ගෙවීම් කිරීම සඳහා

"ඒ ආකෘතිය"

මැතිවරණ කොමසාරිස් ජනරාල්,

දිනය:-

පාර්ලිමේන්තු මැතිවරණය - 2024.11.14

**මැතිවරණ රාජකාරි සඳහා සේවයේ යොදවන ලද නිලධාරීන්ගේ ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීම**

2024.11.14 දින පැවති පාර්ලිමේන්තු මැතිවරණයේ රාජකාරි කටයුතු වල යෙදුණු මෙම ආයතනයේ නිලධාරීන්ට ඔබේ සමාංක හා 2024.11.18 දිනැති PE/2024/65 දරන ගෙවීම් චක්‍රලේඛය අනුව

රු.......................................................................................................................කුත් ශත ..................... ක මුදලක් ගෙවා ඇත/ නැත. එම එක් එක් නිලධරයාට කරන ලද ගෙවීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

2. මෙම මුදල ගෙවීම්/ ප්‍රතිපූර්ණය කරනු පිණිස ........................................................................................ (ඉංග්‍රීසි භාෂාවෙන් ලිවිය යුතුය) නිල නමින් ඇති අංක ....................................................... දරන බැංකු ගිණුමට බැර කරන්න/ එසේ නැතහොත් ප්‍රතිපාදන එවන්න.

ආයතනයේ නම :-

වැය ශීර්ෂ අංකය :- (......................) මධ්‍යම රජය/පළාත් පාලන/ව්‍යවස්ථාපිත ආයතන/වෙනත් (නොගැලපෙන වචන කපා හරින්න)

ආයතනයේ ලිපිනය :-

දුරකථන අංකය :-

බැංකු ගිණුමේ නිල නාමය (ඉංග්‍රීසි භාෂාවෙන්):-

.....................................................

(ආයතන ප්‍රධානියා)

බැංකු ගිණුම අයත් බැංකුව :-

බැංකු ශාඛාවේ නම :-

| නිල බැංකු ගිණුම පවත්නා බැංකුවේ කේත අංකය | නිල බැංකු ගිණුම පවත්නා බැංකු ශාඛාවේ කේත අංකය | නිල බැංකු ගිණුම් අංකය |
|---|---|---|
| | | |

| | | | | | | | | | මැතිවරණ දීමනා | | | නිලධරයා කැටුව යන රජයේ සේවයේ නොවන රියදුරු / කා.කා.ස. | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | (01) | (02) | (03) | (04) | (05) * | (06) | (07) | (08) | (09) | (10) | (11) | (12) | (13) |
| අනු අංකය | නිලධරයාගේ නම | ස්ථිර තනතුර | ඡන්ද විමසීමේ යෙදුණු දිස්ත්‍රික්කය | මැතිවරණ රාජකාරි කටයුතු කළ තනතුර | ස්ථිර **හෝ** කල්පිත සේවා ස්ථානය සිට මැතිවරණ රාජකාරි සඳහා සේවයේ යොදවන ස්ථානය දක්වා **ගමන යාමට (එක් දිශාවකට)** ඇති **කෙටි දුර** ප්‍රමාණය (km) | සංයුක්ත දීමනාව ගෙවූ දින ගණන | ගමන් වියදම/ සැතපුම් කුලිය | සංයුක්ත දීමනාව | ඡන්ද පොළ කටයුතු | ගණන් කිරීම | නිකුත් කිරීම හා භාර ගැනීම | කා.කා.ස./ රියදුරු ගමන් වියදම හා සංයුක්ත දීමනාව | කා.කා.ස./ රියදුරු දීමනාව |
| | | | | | | | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| 1. | | | | | | | | | | | | | |
| 2. | | | | | | | | | | | | | |
| 3. | | | | | | | | | | | | | |
| එකතුව | | | | | | | | | | | | | |

(05) * නිලධරයා තමන් පදිංචි නිවසෙහි සිට ගමන ආරම්භ කරන්නේ නම් හා එම නිවස ඔහුගේ සේවා ස්ථානයේ සිට කිලෝමීටර් 24 ක් ඇතුළත පිහිටා ඇත්නම් එකී නිවස ඔහුගේ කල්පිත රාජකාරි සේවා ස්ථානය සේ සලකා ගෙවීම් කළ හැකිය. එසේ නැතිනම් ගමන ආරම්භ කරන ස්ථානය ලෙස සැලකිය යුත්තේ නිලධරයාගේ ස්ථිර සේවා ස්ථානයයි.*ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු කැටුව යන රජයේ සේවකයකු නොවන සහායකයකුගේ කල්පිත සේවා ස්ථානය ලෙස සැලකිය යුත්තේ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ ස්ථිර සේවා ස්ථානයයි.

සකස් කළේ :-
අත්සන හා දිනය :
නම හා තනතුර :
ජංගම දුරකථන අංකය :

පරීක්ෂා කළේ :-
අත්සන හා දිනය :
නම හා තනතුර :
ජංගම දුරකථන අංකය :

සහතික කළේ :-
අත්සන හා දිනය :
නම හා තනතුර :

"බී ආකෘතිය"

දිනය:-

මැතිවරණ කොමසාරිස් ජනරාල්,

## පාර්ලිමේන්තු මැතිවරණය - 2024.11.14

**මැතිවරණ රාජකාරී සඳහා සේවයේ යොදවන ලද රජයේ සේවයේ නියුතු රියදුරන්ගේ ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීම**

2024.11.14 දින පැවති පාර්ලිමේන්තු මැතිවරණයේ රාජකාරී කටයුතු වල යෙදුණු මෙම ආයතනයේ නිලධාරීන්ට ඔබේ සමාංක හා 2024.11.18 දිනැති PE/2024/65 දරන ගෙවීම් චක්‍රලේඛය අනුව

රු.............................................................................................. කුත් ශත ..................... ක මුදලක් ගෙවා ඇත/ නැත. එම එක් එක් රියදුරුට කරන ලද ගෙවීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

2. මෙම මුදල ගෙවීම්/ ප්‍රතිපූර්ණය කරනු පිණිස ........................................................................................................ (ඉංග්‍රීසි භාෂාවෙන් ලිවිය යුතුය) නමින් ඇති අංක .......................................................................... දරන බැංකු ගිණුමට බැර කරන්න/ එසේ නැතහොත් ප්‍රතිපාදන එවන්න.

ආයතනයේ නම :-

වැය ශීර්ෂ අංකය :- (......................) මධ්‍යම රජය/පළාත් පාලන/ව්‍යවස්ථාපිත ආයතන/වෙනත් (නොගැලපෙන වචන කපා හරින්න)

ආයතනයේ ලිපිනය :-

දුරකථන අංකය :-

බැංකු ගිණුමේ නිල නාමය (ඉංග්‍රීසි භාෂාවෙන්):-

බැංකු ගිණුම අයත් බැංකුව :-

බැංකු ශාඛාවේ නම :-

..................................................
(ආයතන ප්‍රධානියා)

| නිල බැංකු ගිණුම පවත්නා බැංකුවේ කේත අංකය | නිල බැංකු ගිණුම පවත්නා බැංකු ශාඛාවේ කේත අංකය | නිල බැංකු ගිණුම් අංකය |
|---|---|---|
| | | |

| | (01) | (02) | (03) | (04) | (05) | (06) | (07)* | (08) | (09)* | (10) | | (11) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | රියදුරුගේ නම | මූලික වැටුප (Basic Salary) | වාහනයේ අංකය | වාහනය වෙන්කළ/ සංචිතයේද යන වග | නිලධරයකුට වෙන්කළ වාහනයක් නම් එම නිලධරයාගේ නම | ඡන්ද විමසීමේ යෙදුණු දිස්ත්‍රික්කය | ස්ථිර සේවා ස්ථානය සිට මැතිවරණ රාජකාරී සඳහා සේවයට වාර්තා කල ස්ථානය දක්වා **ගමන යාමට (එක් දිශාවකට)** ඇති **කෙටි දුර** ප්‍රමාණය (km) | සංයුක්ත දීමනාව ගෙවූ දින ගණන | අතිකාල පැය ගණන | ගමන් වියදම් හා සංයුක්ත දීමනාව | | අතිකාල හා නිවාඩු දින වැටුප් | |
| | | | | | | | | | | රු. | ශත | රු. | ශත |
| 1. | | | | | | | | | | | | | |
| 2. | | | | | | | | | | | | | |
| 3. | | | | | | | | | | | | | |
| එකතුව | | | | | | | | | | | | | |

(09) * අතිකාල පැය ගණනය කිරීමේදී රියදුරු පැමිණීමේ සහතිකය වන CE 51 හි සඳහන් පැය ගණන ද සේවයෙන් මුදාහරින වේලාව සිට ස්ථිර සේවා ස්ථානය දක්වා නැවත පැමිණීම සඳහා ගතවන කාලය ද (දුර ප්‍රමාණය (Km) අනුව) සැලකිල්ලට ගතයුතුය. CE 51 හි වෙනසක් සිදු කොට ඇත්නම් එහි නිරවද්‍යතාව අදාළ සහකාර තේරීම්භාර නිලධාරී (ප්‍රවාහන) මගින් තහවුරු කර ගත යුතුය. තවද වැඩකරන දිනයකදී රාජකාරී පැය ගණන වන පැය 09 සේවා කාලය තම සේවය සඳහා පැමිණි වේලාවෙන් (ධාවන සටහන් අනුව) අඩුකර ගෙවීම් කටයුතු සිදු කල යුතුය.

සකස් කළේ :-

අත්සන හා දිනය :

නම හා තනතුර :

ජංගම දුරකථන අංකය :

පරීක්ෂා කළේ :-

අත්සන හා දිනය :

නම හා තනතුර :

ජංගම දුරකථන අංකය :

සහතික කළේ :-

අත්සන හා දිනය :

නම හා තනතුර :